## 227 - පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

### 1. මූල්‍ය ප්‍රකාශන

-------------------

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුලි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

#### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේවගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

#### (අ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය<br>------------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------- | නිර්දේශය<br>-------------- |
|---|---|---|---|
| (I) | මූල්‍ය ප්‍රකාශන අනුව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් දරන ලද වියදම රු.609,218,645ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එය රු.609,514,326ක් ලෙස දැක්වීම නිසා රු.295,681ක නොසැසඳීමක් සහිතව වාර්තා කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් දරන ලද වියදම රු.609,218,645ක් ලෙස ගිණුම් වල සඳහන් කර ඇත. | වියදම් නිවැරදිව ගිණුම් ගත කිරීම. |
| (II) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් හි දක්වා තිබූ සහනාධාර සහ මාරු කිරීම්වල වටිනාකම රු.3,946,489ක් වුවද ඒසීඒ 2 (ii) ආකෘතියේ මුදල් පොතට අනුව එය රු.3,882,466ක් ලෙස දක්වා තිබූ බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.64,023ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සහනාධාර හා මාරුකිරීම් වටිනාකම් ලෙස ගැලපීමේදී ප්‍රමාදයකින් එම වැය විෂයයහි බැර සටහන් ගලපා නොමැති බැවින් එම වෙනස පෙන්නුම් කර ඇත. | නිවැරදි තොරතුරු ගිණුම් මඟින් ඉදිරිපත් කිරීම |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය<br>------------------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------ | නිර්දේශය<br>------------ |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ කේවල ශේෂ ලේඛණය අනුව දෙපාර්තමේන්තුවට අයවිය යුතු මුළු ශේෂ එකතුව රු.138,870,752ක් වුව ද පාලන ගිණුම් අනුව එම අගය රු.138,872,896ක් වූ බැවින් කේවල ශේෂ හා පාලන ගිණුම් අතර රු.2,144ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස 2020 වර්ෂයේ දී ද විගණනය විසින් අනාවරණය කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය දක්වා නිවැරදි කර නොතිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | නිවැරදි තොරතුරු ගිණුම් මඟින් ඉදිරිපත් කිරීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 හි 07 ඡේදය ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුව විසින් අර්ධ වාර්ෂික ආදායම් වාර්තා අදාල කාල සීමාව අවසන් වූ දින සිට දින 15ක් ඇතුළත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේතුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කාල සීමාව අවසන් වි දින 15ක් ඇතුලත අදාල වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ආදායම් නිසිපරිදි වාර්තා කිරීම. |
| (ආ) | 2021 දෙසැම්බර් 08 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛ අංක DRP/OP/01/DS/03 (වෙළුම iii) ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ආදායම් වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ලබාදිය යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 56ක් නියමිත පරිදි මාසික ආදායම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණු බව 2022 පෙබරවාරි 24 දින පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ උපකාරක සේවාව (Help desk) පරීක්ෂා කිරීමේදී අනාවරණය විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | අභ්‍යන්තර චක්‍රලේඛයන්ට අනුකූල වීම. |
| (ඇ) | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂයේ මුළු ආදායම රු.198,886,160ක් වුවද 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව අනුව එය රු.198,885,410ක් ලෙස සඳහන් කර තිබුණි. | 2021 වර්ෂයේ අවසාන සංශෝධිත භාණ්ඩාගාර මුද්‍රිත සටහන නිකුත් කිරීම ප්‍රමාද වූ බැවින් 2021 ප්‍රගති වාර්තාව සංශෝධිත භාණ්ඩාගාර මුද්‍රිත සටහනට පෙර සකස් කර ඇත. | ආදායම නිවැරදිව හා කාලීනව හඳුනා ගැනීම. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා සමස්ථ වියදම්වල ශුද්ධ ප්‍රතිපාදනය රු.1,476,150,000ක් වූ අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව දෙපාර්තමේන්තුව විසින් දරන ලද | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එකඟ වූ ඉතිරි කිරීම් හා කොවිඩ් 19 වසංගත | නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු |

| | | | |
|---|---|---|---|
| | මුළු වියදම රු.1,261,459,299ක් වූ බැවින් සමස්ථ ඉතිරිය රු.214,690,701ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15ක් විය. එසේම වැය විෂයයන් අනුව පරීක්ෂවේ දී වෙන්කල ප්‍රතිපාදන වලින් සියයට 61 සිට සියයට 92 දක්වා පරාසයක මෙම ඉතිරි වීම් විහිදී තිබුණි. | තත්ත්වය හේතුවෙන් බලාපොරොත්තු වූ ආකාරයට වියදම් සිදු නොවීම. | සකස් කිරීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කල ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.210,950,000න් රු.89,436,526ක් පමණක් වියදම් කර තිබුණු බැවින් ඉතිරිය රු.121,513,474ක් හෙවත් ශුද්ධ ප්‍රග්ධන ප්‍රතිපාදනයෙන් සියයට 58ක් විය. වැය විෂයය අංක 2509 යටතේ වෙනත් මූලධන වියදම් සඳහා වෙන් කර තිබුණු රු.180,000,000න් රු.118,919,524ක් ඉතිරි වීම මෙයට ප්‍රධාන හේතුව වී තිබුණි. | වැය විෂය අංක **2509** යටතේ රු.මි.56ක් පෞද්ගලික ආයතනයකට ගෙවීමට ඇති මුදල සඳහා ගෙවීම් කිරීමට අනුමැතිය නොලැබීම හා කාඩ්පත් මිලියනයක ප්‍රසම්පාදනය ආරම්භ කිරීම සඳහා සලසා ගත් ප්‍රතිපාදන වලින් කොටසක්ද පැවතීම හේතුවෙන් මෙම ඉතිරි වීම් පවතී. | නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු සකස් කිරීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මුද්‍රණය කරන ලද මුළු හැඳුනුම්පත් සංඛ්‍යාව 442,341ක් වූ අතර ඉන් 26,489ක් හෙවත් සියයට 6ක් දෝෂ සහිත විය. දෝෂ සහිත හැඳුනුම්පත් වල පිරිවැය රු.1,669,286ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් අනාවරණය කර නොතිබුණි. | මුද්‍රණය කරන ලද දෝෂ සහිත හැඳුනුම්පත් මූ.රෙ.102 යටතේ හානි යටතට ගැනෙන පාඩුවක් ලෙස අර්ථකතනය වී නැත. එමෙන්ම සිගාස් වැඩසටහන යටතේ මූල්‍ය නොවන වත්කමක් යටතේ ගිණුම්ගත වීමක්ද සිදුනොවේ. ඉන්වෙන්ට්‍රි භාණ්ඩයක් ලෙස ගිණුම්ගත කිරීමක් සිදු නොවන බැවින් පාඩුවක් ලෙස ගිණුම්ගත කිරීමක්ද සිදු කර නැත. | මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි දත්ත අනාවරණය කිරීම. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෞද්ගලික ආයතනයකින් 2020 වර්ෂයේ දී සිදුකල කාඩ්පත් ප්‍රසම්පාදනය වෙනුවෙන් රු.56,492,100ක් නිරවුල් කිරීමට තිබුණි. එය 2020 සහ 2021 වර්ෂ දෙකේම බැරකම් ලෙස ගිණුම්ගත නොකර බැඳීම් ලෙස දක්වා තිබුණු අතර විගණිත දින දක්වා පියවීමට ද කටයුතු කර නොතිබුණි. | රඳවා තබා ගන්නා ලද මුදල ගෙවීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා කෙටුම්පත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කිරීම හා අදාළ පියවීම් විධිමත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වැය විෂයය අංක 227-01-01-1201 යටතේ වෙන් කල ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා රු.1,347,116ක බැදීම්වලට එලඹී තිබුණි. | වැය විෂය අංක 1201 යටතේ ප්‍රතිපාදන විශාල වශයෙන් ඉතිරි වේ යැයි කරන ලද අනුමානයට අනුව, එම අවස්ථාවේ පැවති අවශ්‍යතා අනුව වෙනත් භාණ්ඩ මිළ දී ගැනීම සිදු කර ඇත. | වියදම් කලමනාකරණය විධිමත්කිරීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i) මු.රෙ.135 (5) | | දෙපාර්තමේන්තුව විසින් ආදායම් සම්බන්ධ බලතල පැවරීමක් සිදු කර නොතිබුණි. | 2022 වසරේ සිට ආදායම් සම්බන්ධ බලතල පැවරීම් සිදු කිරිමට කටයුතු කරනු ඇත. | යොමුගත රෙගුලාසියට අනුකූල වීම. |
| | (ii)මු.රෙ.565 (4) | | තැන්පත්වලින් සිදුකරන ගෙවීම් සම්මත කිරීම සඳහා බලයලත් මාණ්ඩලික නිළධාරියෙකු විසින් කෙටි අත්සන් යෙදිය යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගනු ලබන පොදු තැන්පත් ලෙජරයේ ගෙවීම් බලයලත් මාණ්ඩලික නිලධාරියෙකු විසින් සම්මත නොකල අවස්ථා තිබුණි. | තැන්පත් ලෙජරය තුල තාවකාලිකව ඇතුලත් කර ඇති මුදල් ආපසු ගෙවීම් වලදී ඇතැම් අවස්ථා වල බලයලත් මාණ්ඩලික නිලධාරීගේ කෙටි අත්සන යෙදීම ප්‍රමාද දෝෂයකින් මගහැරි ඇත. | - එම - |

**2.5** **අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 01 සිට වසර 14 දක්වා කාලපරාසයක් තුළ මිය ගිය, වැඩ තහනම් කළ සහ සේවය අතහැර ගිය නිළධාරීන් 4 දෙනකුගෙන් අයවිය යුතු එකතුව රු.229,568ක් 2021 දෙසැම්බර් 31 දක්වා අයකරගෙන නොතිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | කාර්යක්ෂමව ණය ශේෂ නිරවුල් කර ගැනීම. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පරීක්ෂාවේදී සැලසුම් කළ කාර්යයන්හි ප්‍රගතිය සියයට 8 සිට සියයට 50 දක්වා විහිදී තිබුණු අවස්ථා 4ක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | ප්‍රමාණවත් කාර්යසාධන මට්ටමක් පවත්වාගෙන යාම. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත විය යුතු පහත සඳහන් තොරතුරු පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ 2021 ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත වී නොතිබුණි.<br><br>(I) 12 (ආ) ප්‍රකාරව වර්ෂය සඳහා අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කල ක්‍රියාකාරකම් සැලැස්ම ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම/ ප්‍රතිඵල<br><br>(II) 12 (ඇ) ප්‍රකාරව ආදායම් දෙපාර්තමේන්තු විසින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල සඳහන් එක් එක් ආදායම් ශීර්ෂයන් සඳහා අනුමත ආදායම් වෙනුවෙන් ආදායම් එකතු කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | යොමුගත චක්‍රලේඛයට අනුකූල වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්(KPIs) අතුරින් ප්‍රධාන දර්ශකයක් වන "වාර්ෂික සාමාන්‍ය සේවය යටතේ ලද අයදුම්පත්වලින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාවේ" ප්‍රතිශතය සමාලෝචිත වර්ෂයේ සියයට 62ක් බව විගණනයේ දී නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | කාර්ය සාධන දර්ශක උපරිම මට්ටමින් පවත්වාගෙන යාම. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය නවීකරණය කර ආරක්ෂිත විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමේ අවශ්‍යතාවය මත පුරවැසියන් ලියාපදිංචි කිරීම, විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම හා විද්‍යුත් ජාතික නාම ලේඛනය ස්ථාපිත කිරීම යන අංග ඇතුළත්ව විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය 2006 වර්ෂයේ දී හඳුන්වා දී තිබුණි. 2006 වර්ෂයේ සිට එක් එක් අවස්ථාවන්හීදී ව්‍යාපෘති කාලය දීර්ඝ කරමින් හා ව්‍යාපෘති සැලැස්ම කිහිප අවස්ථාවකදීම සංශෝධනය කරමින් කටයුතු කර තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට මුළු වියදම රු. මිලියන 2658.33ක් වුවද ''විද්‍යුත් ජාතික හැඳුනුම්පතක්'' නිකුත් කිරීමේ අදියර දක්වා ප්‍රගතියක් අත් කර ගැනීමට විගණිත දින දක්වාම ව්‍යාපෘතිය අපොහොසත් වී තිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | ව්‍යාපෘති කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම. |
| (ආ) | ව්‍යාපෘතියේ සමස්ථ ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 8000.69ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ප්‍රගති වාර්තාව අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට සමස්ථ ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගතිය සියයට 81 ක් හා එහි මූල්‍ය ප්‍රගතිය සියයට 33ක් විය. ඒ අනුව ව්‍යාපෘති ඇස්තමේන්තු පිළියෙල කිරීම, වියදම් අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය හා වාර්තා කිරීම සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු වී නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | ව්‍යාපෘති සැලසුම් හා අධීක්ෂණය සම්බන්ධ කටයුතු නිවැරදිව හා තාත්විකව සිදු කිරීම. |
| (ඇ) | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ 2021 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන කාර්යයන් 47ක් ඇතුළත්ව පිළියෙල කර තිබුණ ද ප්‍රධාන කාර්යයන් 8ක ඇතුළත් උපකාර්යයන් 17ක් සමාලෝචිත වර්ෂයට අදාළ නොවූ අතර 2020 හා 2022 වර්ෂයන්හි සැලසුම්ගත කාර්යයන් බව විගණනයේදී නිරීක්ෂණය වූ බැවින් අදාල සැලසුම් ක්‍රියාවලිය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | ව්‍යාපෘති සැලසුම් නිවැරදිව හා තාත්විකව සකස් කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 වර්ෂය සඳහා පිළියෙල කරන ලද සංශෝධිත අයවැය ඇස්තමේන්තුව අනුව වියදම රු.මිලියන 618ක් වුව ද සමාලෝචිත වර්ෂය අවසානයට තත්‍ය වියදම රු.මිලියන 332ක්වූ බැවින් වෙන්කල ප්‍රතිපාදනයෙන් රු.මිලියන 286 ක් හෙවත් සියයට 46ක් ඉතිරි වී තිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | තාත්වික හා නිවැරදි ඇස්තමේන්තු සැකසීම හා විධිමත් සම්බන්ධීකරණය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් ඊට සමගාමීව ව්‍යාපෘති ප්‍රගති වාර්තාවේ ඇතුළත් කර නොතිබුණු අතර එක් එක් වර්ෂයන්හි සිදු කිරීමට බලාපොරොත්තු වූ කාර්යයන් වෙනුවට මුළු ව්‍යාපෘති කාලය තුළදී ම නිම කිරීමට බලාපොරොත්තු වූ ප්‍රධාන කාර්යයන් ඇතුලත් කර ප්‍රගතිය සකස් කර තිබුණි.ඒ අනුව අදාළ කාර්යයන් ඇගයීමට ලක්කිරීම විගණනයේ දී ගැටළු සහගත විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | ව්‍යාපෘති සැලසුම් හා ප්‍රගතිය වාර්තා කිරීම සම්බන්ධයෙන් අනුකූලතාවයක් පැවතිය යුතුය. |
| (ඊ) | ව්‍යාපෘති වියදම් වාර්තාව අනුව 2021 වර්ෂයේ දී කාර්යයන් 04 ක් සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර තවත් කාර්යයන් 04ක් වෙනුවෙන් වෙන් කල ප්‍රතිපාදනයෙන් සියයට 60 සිට සියයට 95 දක්වා පරාසයක ඉතුරුම් පැවති බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | තාත්වික හා නිවැරදි ඇස්තමේන්තු සැකසීම. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ අනු කාර්යයන් 8ක් වෙනුවෙන් වෙන් කර තිබූ ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණු අතර විදුලිය හා ජලය වෙනුවෙන් වෙන් කල ප්‍රතිපාදනය ඉක්මවා. රු. මිලියන 10.73 ක් හෙවත් සියයට 894 ක් වියදම් කර තිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | තාත්වික හා නිවැරදි ඇස්තමේන්තු සැකසීම. |
| (ඌ) | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය යටතේ ප්‍රාග්ධන පිරිවැය (capital cost) සඳහා ව්‍යාපෘති ඇස්තමේන්තුව තුළ ප්‍රතිපාදන වෙන් කර නොතිබුණු නමුත් 2021 වර්ෂය ආරම්භ වන විට වාහන 2 ක් මිළදී ගැනිම වෙනුවෙන් රු. මිලියන 19.35 ක් වියදම් දරා තිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඇතුළත අදාළ වියදම් කලමානාකරණය කිරීම. |
| (එ) | මූලික අරමුණු ඉටුකර ගැනීමට මේ දක්වා ව්‍යාපෘතියට නොහැකි වුවද 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු. මිලියන 79.69ක සේවක මණ්ඩල වැටුප් හා දීමනා ඇතුළුව ව්‍යාපෘතියේ පරිපාලන කටයුතු වෙනුවෙන් රු. මිලියන 199.69ක් වියදම් කර තිබුණි. 2021 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ තත්‍ය කාර්ය මණ්ඩලය 29ක් විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | අරමුණු පෙරදැරි කරගෙන කාර්යක්ෂමව හා ඵලදායීව වියදම් පාලනය කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියෙහි ප්‍රධාන කාර්යයන් දෙකක් වන භෞතික යටිතල පහසුකම් සංවර්ධනය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 1115.26 ක් වැය කර ඇතත් පුද්ගල දත්ත ඩිජිටල්කරණයෙහි භෞතික ප්‍රගතියක් මේ දක්වා නොමැති බැවින් අදාල පිරිවැයෙහි ඵලදායිතාවය ඉතා අඩු මට්ටමක පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | කාර්යක්ෂමව හා ඵලදායීව රාජ්‍ය වියදම් කලමානාකරණය කිරීම. |
| (ඔ) | (i) සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසයේදී නිලධාරීන් හතර දෙනෙකු මානව සම්පත් හා පුහුණු වැඩසටහන් වෙනුවෙන් බඳවා ගෙන තිබුණු නමුත් කිසිදු පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහනක් එම නිලධාරීන් ලවා ක්‍රියාත්මක කර නොතිබුණි. එසේ වුවද එම නිලධාරීන් සඳහා 2021 වර්ෂයේ දී රු.817,530ක වැටුප් හා දීමනා ගෙවීම් කර තිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | කාර්යක්ෂමව හා ඵලදායීව රාජ්‍ය වියදම් කලමානාකරණය කිරීම. |
| | (ii) විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමට අදාල මෘදුකාංග හා දත්ත රැස් කිරීමේ කාර්යයට අදාල අනෙකුත් තාක්ෂණික උපාංග ලබා දීම ICTA ආයතනය විසින් සිදු කල යුතු වුවද 2021 වර්ෂය අවසානය දක්වා අදාල උපාංග ලබා නොදී තිබියදීත් සැලසුම් සහගත නොවන අයුරින් ඉහත (i) පරිදි නව බඳවා ගැනීම් සිදු කර තිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | කාර්ය මණ්ඩල පරිපාලනය විධිමත් කිරීම. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ දී ප්‍රසම්පාදන කාර්යයන් 6ක් වෙනුවෙන් ඇස්තමේන්තුගත වටිනාකම ඉක්මවා සියයට 7 සිට සියයට 63 දක්වා වැඩිපුර වියදම් දරා තිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන්දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | ප්‍රසම්පාදන කාර්යයන් විධිමත් කිරීම. |

## 3.3 වෙනත් නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා 2021 දෙසැම්බර් 31 දිනට නීති අංශය වෙත ලැබී ඇති මුළු දෝෂ සහිත අයදුම්පත් සංඛ්‍යාව 2067ක් වූ අතර ඒ තුළ පිළිවෙලින් 2018 හා 2019 වර්ෂවල ලැබුණු අයදුම්පත් 185ක් හා 348ක් ද විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | අයදුම්පත් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රධාන තොග ලෙජරයෙන් මුද්‍රණ අංශයට පෙර මුද්‍රිත කාඩ්පත් නිකුත් කිරීමේ දී එම ප්‍රධාන ගබඩාවේ කාඩ්පත් වල ආරක්ෂිත තොගයක් පවත්වා නොගෙන මුළු කාඩ්පත් ප්‍රමාණයම මුද්‍රණ අංශයට නිකුත් කර තිබුණු අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | තොග පාලනය විධිමත් කිරීම. |
| (ඇ) | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය මඟින් “2021 වර්ෂයේ අයදුම්පත් පිළිබඳ වාර්තා” (All Applications Process Report) 2022 වර්ෂය තුළ ලබා ගැනීමේදී එක් එක් අවස්ථාවල ලැබෙන තොරතුරු එකිනෙකට වෙනස් බව විගණනයේ දී නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | පරිගණක පද්ධතිය කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතා කිරීම. |

## 3.4 ප්‍රසම්පාදනයන්

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 4 වැනි පරිච්ඡේදයේ 4.1.1 (අ) හා 4.2.1(ආ) වගන්තිය ප්‍රකාරව සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සැලසුම් කිරීම සිදුකල යුතු අතර අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවද එක් වර්ෂයක ප්‍රසම්පාදන කටයුතු පමණක් සැලැස්මේ ඇතුලත් කර තිබුණි. | හඳුනා ගනු ලැබූ අවශ්‍යතා 2022 වර්ෂයේ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මට ලැයිස්තුගත කිරීමට ද ඉදිරි වර්ෂවල ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ලැයිස්තුගත කිරීමටද කටයුතු කරනු ඇත. | යොමුගත මාර්ගෝපදේශයට අනුකූල වීම. |
| (ආ) | 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛයේ 4 ඡේදය හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රයේ 4.2.1 ආකෘතිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2022 වර්ෂයේ දී සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරනු ඇත. | යොමුගත චක්‍රලේඛයට අනුකූලව සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම. |
| (ඇ) | සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම හා ඊට සමගාමීව සත්‍ය වියදම් පරීක්ෂා කිරීමේ දී සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම තුළ අන්තර්ගත අයිතම 66කින් අයිතම 50කම ඇස්තමේන්තුගත වටිනාකම හා සත්‍ය වටිනාකම් සමාන බැවින් සත්‍ය වියදම් දැරූ පසු ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර තිබෙන බව අනාවරණය විය. මේ තුළින් සැළැස්ම සකස් කිරීමේ අරමුණු ඉටුනොවන බව විගණනයේදී නිරීක්ෂණය වේ. | ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කරන අවස්ථාවේ දී අලුතින් ඇතිවන අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන නිවැරදිව නිශ්චය කර ගැනීමත්, එතෙක් සිදු කරනු ලැබූ ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් දරා ඇති සත්‍ය වියදම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කිරීමත් සිදු වනු ඇත. | කාර්යක්ෂම හා ඵලදායී ලෙස සැලැසුම් සකස් කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් Epson L805 වර්ගයේ මුද්‍රණ යන්ත්‍රවලට අවශ්‍ය තීන්ත මිල දී ගැනීම සඳහා 2021 පෙබරවාරි 02 දින ආයතන 05 කින් මිල කැඳවීම් සිදු කර ඇති අතර ආයතන 02කින් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද ලංසු විවෘත කිරීමේ වාර්තාව තුළ ලංසු 6කට අදාල තොරතුරු ඉදිරිපත් කර තිබුණි. එසේම ලංසු විවෘත කිරීමේ වාර්තාවේ මිළ ගණන් කැඳවීමට පෙර වර්ෂයක, එනම් 2020 වර්ෂයේ දිනයක් සඳහන් කර තිබුණි. | ලංසු විවෘත කිරීමේ වාර්තාව සකස් කිරීමේදී පරිගණක මතකයේ ගබඩා කර තිබූ පූර්ව ලංසු විවෘත කිරීමේ වාර්තාවක් සංශෝධනය කර ඇති අතර ප්‍රමාදයකින් ලංසු විවෘත කිරීමේ සටහනෙහි දිනය 2020/02/09 ලෙස වර්ෂය වැරදියට සටහන් කර ඇත. | ප්‍රසම්පාදනය කාර්යක්ෂම හා විධිමත් කිරීම. |
| (ඉ) | (i) මෙම දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ නඩත්තු හා සංවර්ධන කටයුතු සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2020 ඔක්තෝම්බර් 27 දින සිට 2021 ඔක්තෝම්බර් 26 දින දක්වා එළඹී ඇති ගිවිසුමේ ආරම්භක දිනයට මාස දෙකකට පසුව එනම් 2020 දෙසැම්බර් 21 දින ගිවිසුම අත්සන් කර තිබුණු අතර අදාළ සේවාව සම්බන්ධ ප්‍රසම්පාදන කමිටු තීරණය ලබා දී තිබුණේ ද ගිවිසුමේ සඳහන් ආරම්භක දිනයට පසු දිනයක් වූ 2020 දෙසැම්බර් 10 දින දීය. | මෙම ආයතනය සමඟ පෙර වර්ෂයන්හි පැවති ගිවිසුම් වල නොමැති කොන්දේසි පිළිබඳ නිර්දේශ ලබා ගැනීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයට යොමු කිරීම නිසා ප්‍රමාද වීම සිදු වී ඇත. | ගිවිසුම් යාවත්කාලීනව පවත්වාගෙන යාම. |
| | (ii) 2020 ඔක්තෝම්බර් 27 දින සිට 2021 ඔක්තෝම්බර් 26 දින දක්වා දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ නඩත්තු සහ සංවර්ධන කටයුතු වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම් ගත වීමට පෙර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) වෙතින් ලබා ගත් නිර්දේශ අනුව ගිවිසුමට ඇතුළත් කළ යුතු වාර්ෂිකව ගෙවීම් කල යුතු, මුද්‍රණය කිරීමට පෙර අදියරේ පවතින අවම අයදුම්පත් (Processed Application ) ප්‍රමාණය පසුගිය වසරවල පැවති තත්ත්වය සළකා සංශෝධනය කළ යුතු වුවද ප්‍රසම්පාදන කමිටුව විසින් පෙර වසරවල පැවති තත්වය සළකා බැලීමෙන් තොරව පැවති ගිවිසුමේ කොන්දේසිවලට යටත්වම එම පෞද්ගලික ආයතනය සමඟ නැවත ගිවිසුම් ගත වී තිබුණි. එබැවින් 2021 වර්ෂයේදී ගිවිසුම් ගත වූ කාලපරිච්ඡේදයට අදාළව මුද්‍රණය කිරීමට පෙර අදියරේ පවතින අයදුම්පත් සංඛ්‍යාව 458,173ක් වුවද අයදුම්පත් මිලියනයක් සඳහා ගෙවීම් කිරීමට සිදුවී තිබුණි. මෙම කාලපරිච්ඡේදයේ දී නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව 319,592ක් විය. | සංශෝධිත කෙටුම්පත් ගිවිසුමේ පරිගණක මෘදුකාංගයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් අමතර වියදමක් දෙපාර්තමේන්තුව විසින් දැරිය යුතු බවට ඇතුළත්ව තිබුණු කොන්දේසිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය විසින් ඉවත් කර තිබුණු බැවින් පෙර පැවති ගිවිසුම පරිදිම නැවත ගිවිසුම් ගත වී කාල පරිච්ඡේදය තුල අවම වශයෙන් අයදුම්පත් මිලියනයක් සඳහා ගෙවීම් කටයුතු සිදු කර ඇත. | ගිවිසුම් ඵලදායීව පවත්වාගෙන යාම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2021 වර්ෂයේ දී ජාතික හැඳුනුම්පත් සඳහා PVC කාඩ්පත් ලක්ෂ 4ක් මිලදී ගැනීම හා පෙර මුද්‍රිත අංග (Art Work) මුද්‍රණය කිරීම ප්‍රසම්පාදන ක්‍රියාවලින් දෙකක් ලෙස සිදුකර තිබුණ ද ඒ සඳහා එකම සැපයුම්කරුවෙකු තෝරාගෙන තිබුණු බැවින් දෙපාර්මේන්තුව විසින් ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් අමතර කාලයක් හා පිරිවැයක් දරා ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය. උක්ත කාර්යයන් දෙක සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලින් දෙකක් සිදු කළ ද 2021 ජුනි 18 දින දෙපාර්තමේන්තුව විසින් PVC කාඩ්පත් ලක්ෂ 2ක් නැවත මිලදී ගැනීම හා පෙර මුද්‍රිත අංග මුද්‍රණය කිරීම යන කාර්යයන් දෙකම එකම ප්‍රති ඇණවුමකින් සිදු කර ඇති බවද නිරීක්ෂණය විය. | අයදුම්පත් විශාල සංඛ්‍යාවක් පැවති බැවින් කඩිනමින් ජාතික හැඳුනුම්පත් ලබා දීමේ අවශ්‍යතාවය මත හිස් කාඩ්පත් මිලදී ගෙන අවම පිරිවැයකින් දෙපාර්තමේන්තුවේ ලේසර් මුද්‍රණ යන්ත්‍ර මඟින් මුද්‍රණය කිරීමට තීරණය වුවද ඒ සඳහා විශාල කාලයක් ගතවන බැවින් මුද්‍රණ කටයුතු සඳහා නැවත මිල ගණන් කැඳවා පෙර මුද්‍රණ කටයුතු බාහිර ආයතනයක් මඟින් සිදු කරවා ගෙන ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම හා ඵලදායී කිරීම. |

**3.5 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සැලසුම් කරන ලද කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් 5ක් පවත්වා නොතිබුණු අතර ඒ සඳහා ඇස්තමේන්තු කල මුදල රු.725,000ක් විය. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | කාර්යයයක්ෂම හා ඵලදායී ලෙස පුහුණු වැඩසටහන් පැවැත්වීම. |
| (ආ) | ලියාපදිංචි කිරීම්, තත්ව පරීක්ෂාව, අනුමත කිරීම, ලේඛන පරීක්ෂාව, දත්ත ඇතුළත් කිරීම, සිංහල දෙමළ පරිවර්තනය පිළිබඳ පුහුණු පාඨමාලා සහ සේවාරම්භක පුහුණුව සඳහා නිළධාරීන් 266ක් සහභාගි කර ගැනීමට සැලසුම් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ නිළධාරීන් 58 දෙනෙකු සඳහා සේවාරම්භක පුහුණුව පමණක් සිදු කර ඇති අතර වර්ෂය අවසන් වන විටත් ඇස්තමේන්තු ගත රු.160,000ක මුළු මුදලම ඉතිරි වීතිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | -එම- |
| (ඇ) | නිළධාරීන් 145 දෙනෙකු සඳහා රාජ්‍ය භාෂා ඉංග්‍රිසි පාඨමාලාව වෙනුවෙන් රු.125,000ක් ඇස්තමේන්තු ගත කර ඇති නමුත් සමාලෝචිත වර්ෂයේ එක් නිලධාරියෙකු සඳහා පමණක් රු.40,000ක් වියදම් කර තිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා "මුදල් රෙගුලාසි, කාර්යාල කාර්ය පටිපාටික රීති, නිවාඩු හා ආයතන සංග්‍රහය" යන පුහුණු වැඩසටහන වෙනුවෙන් රු.120,000ක් ඇස්තමේන්තු ගත කර ඇතත් 2021 වර්ෂයේ දී එම පුහුණු වැඩසටහන යටතේ උප පුහුණු වැඩ සටහන් 15ක් පවත්වා ඒ වෙනුවෙන් රු.702,220ක් වැය කර තිබුණි. | නිරීක්ෂණය සඳහා ගණන් දීමේ නිලධාරීගේ පිළිතුරු ලැබී නොමැත. | -එම- |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 1475ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩල 1278ක් වූ බැවින් පුරප්පාඩු සහ අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිවෙලින් 200ක් හා 03ක් විය. | දෙපාර්තමේන්තුව සඳහා උපාධිධාරී අභ්‍යාසලාභී තනතුරු අනුමත කර නැත. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කරන ලද උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරීන් තිදෙනෙක් සේවය සඳහා යොදවා ඇත. | කාර්යමණ්ඩල පරිපාලනය විධිමත් කිරීම. |
| (ආ) | නීති නිලධාරී ඇතුළු තනතුරු 06ක් සඳහා එහි මුළු අනුමත නිලධාරී සංඛ්‍යාවම පුරප්පාඩු වී පැවතුණි. | කොවිඩ් වසංගත තත්ත්වය නිසා අමතර ප්‍රතිපාදන සලසාදීමේ සීමාවන් හේතුවෙන් ඉහත තනතුරුවලට බඳවාගැනීමේ අවශ්‍යතාවය පසුව සලකා බැලීම සුදුසු බව යෝජනා කර ඇත. | -එම- |